(6 ශ්‍රේණියේ තෙවන වාරයේ කාලච්ඡේද 18ක් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාමට මෙම සැලැස්ම සකස් කර ඇත.)

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| 06 ශ්‍රේණිය තෙවන වාරයෙන් තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම් | | | | | | |
| 7.0 ජීවී අජීවී පරිසරයට හිතකාමීව හැසිරෙයි. | 6.7.2 භෞතික පරිසරයේ වටිනාකම තේරුම් ගෙන පරිසර සංරක්ෂණයට දායක වෙයි. | • භෞතික පරිසරය මිනිසා හා බැඳී ඇති බව පැහැදිලි කරයි.<br>• පරිසරය රැක ගැනීම යුතුකමක් බව පිළිගනියි.<br>• පරිසරය සුරැකීම සඳහා ක්‍රියාකාරකම් සැලසුම් කරයි.<br>• පරිසර පවිත්‍රතාවට හුරු වෙයි.<br>• ගහකොළවලට ආදරය කරමින් ඒවා ආරක්ෂා කරය | පරිසරය සංරක්ෂණය, පෝෂණය හා පරිසර දූෂණයෙන් වැළකීම. | | 16. රකින විට පරිසරය රැකෙනු ඇත අප සැවොම | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| 8.0 ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි. | 6.8.1 මහින්දාගමනය හා බැඳුණු සුවිශේෂ සිදුවීම් අගයමින් එම උරුමයන් රැක ගැනීමට කටයුතු කරයි. | • මහින්දාගමනය හා බැඳුණු සුවිශේෂ සිදුවීම් පැහැදිලි කරයි.<br>• මහින්දාගමනයෙන් ලද ශාසනික දායාද රැකගත යුතු බව පිළිගනී.<br>• බෞද්ධ උරුමය යන මැයෙන් පද්‍ය නිර්මාණය කරයි.<br>• බෞද්ධ සංස්කෘතික උරුමයන් ආරක්ෂා කරයි.<br>• බෞද්ධ සිරිත් විරිත්වලට අනුගත ව කටයුතු කරයි. | මහින්දාගමනය (මිහිඳු හිමියන් හා රජතුමා අතර සංවාදය) අනෙකුත් සුවිශේෂ සිදුවීම්. | | 17. මිහිඳු මාහිමි සමය වෙත යමු | 03 |
| 8.0 ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි. | 6.8.2. දුමින්දාගමනයෙන් ලත් දායාද අගයමින් ඒවා රැක ගැනීමට ක්‍රියා කරයි. | • සංඝමිත්තා තෙරණිය වැඩමවීමෙන් අප ලද දායාද පැහැදිලි කරයි.<br>• දුමින්දාගමනයෙන් මෙරට විවිධ ශිල්ප කලාවන්ගේ වර්ධනය සිදු වූ බව පිළිගනී.<br>• දුමින්දාගමනයෙන් ලත් දායාද යන මැයෙන් බිත්ති පුවත්පතට ලිපියක් සකස් කරයි.<br>• සංස්කෘතික අංගයන් රැක ගැනීමට කටයුතු කරයි.<br>• අන්‍යෝන්‍ය සුහදතාවෙන් කටයුතු කරයි. | සංඝමිත්තා තෙරණිය ශ්‍රී මහා බෝධීන්වහන්සේ වැඩම වීම (දුමින්දාගමනය) | | 18. ශාසනික දායාද සුරකිමු | 03 |
| 9.0 බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳින ගෙන ඒ අනුව ක්‍රියා කරයි. | 6.9.1 සම්පත් පරිහරණයට අදාළ බෞද්ධ ඉගැන්වීම් ක්‍රියාවට නගයි. | • සම්පත් පරිහරණයට අදාළ බෞද්ධ ඉගැන්වීම් ගෙනහැර දක්වයි.<br>• සම්පත් පරිහරණය සැලැස්මක් ඇතුව කළ යුතු බව පිළිගනී.<br>• සාකේත නුවර සිටුදේවියගේ කතා වස්තුව නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කරයි.<br>• අධික පරිභෝජනයෙන් වැළකී සරල දිවි පෙවෙතකට හුරු වේ. | අන්ගුත්තර නිකායේ කුල සූත්‍රයට අනුව හා ජීවක කථාවස්තුවේ සාකේත නුවර සිටු දේවියගේ කථාවස්තුවට අනුව සම්පත් | | 19. අරපිරිමැස්ම දියුණුවට මගකි | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| | | • සම්පත් මනාලෙස කළමනාකරණය කර ගැනීමට මව්පියන්ට සහාය වෙයි. | පරිහරණයේ වැදගත් කම පැහැදිළි කිරීම | | | |
| 9.0 බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චිනතනය හැඳින ගෙන ඒ අනුව ක්‍රියා කරයි. | 6.9.2 සම්පත් පරිභෝජනයේ දී දැඩි ලෝභය හානිකර බව පිළිගෙන ක්‍රියා කරයි. | • දැඩි ලෝභය පසු තැවීමට හේතුවන ආකාරය විස්තර කරයි.<br>• සම්පත් රැක ගැනීම අපගේ වගකීමක් බව පිළිගනියි.<br>• නිවැරදි ව සම්පත් පරිහරණය කරමු." යන මාතෘකාව යටතේ බිත්ති පුවත්පතට ලිපියක් නිර්මාණය කරයි.<br>• උපයන සම්පත් සැලසුම් සහගත ව පරිහරණය කරයි.<br>• කෘතගුණ සැලකීමට හුරු වෙයි | ස්වර්ණහංස ජාතකය | | 20. රන් පිහාටු | 03 |
| 10.0 නිර්වානය අරමුණු කොට ගෙන ආර්ය මාර්ගයේ ගමන් කරයී. | 6.10.1 බෞද්ධ ප්‍රතිපදාවේ එන ශ්‍රද්ධාව හා ශ්‍රද්ධාවන්ත යාගේ ලක්ෂණ හැඳින සැදැහැවත් ව කටයුතු කරයි. | • ශ්‍රද්ධාවන්තයකු තුළ දකින්නට ලැබෙන ලක්ෂණ පැහැදිලි කරයි.<br>• බෞද්ධයකු වීමේ මූලික පදනම ශ්‍රද්ධාවෙන් ආරම්භ වන බව පිළිගනියි.<br>• පාසලේ ආගමික වතාවත්වල දී ශ්‍රද්ධාව ජනනය වන ආකාරය දක්වයි. එදිනෙදා ජීවිතයේ දී, ආගමික කටයුතුවල දී ශ්‍රද්ධාවෙන් යුතු ව කටයුතු කරයි.<br>• තුණුරුවන ඇසුරු කොට ගෙන ජීවිතය සාර්ථක කර ගනියි. | ශ්‍රද්ධාව පිළිබඳ සරල හැඳින්වීමක් හා "දස්සන කාමෝ සීලවතං" යන ගාථාව ඇසුරින් ශ්‍රද්ධාවන්තයාගේ ලක්ෂණ පිළිබඳ කෙටි විස්තරයක් | | 21. සැදැහැ ගුණයෙන් සරු වෙමු | 03 |
| එකතුව | | | | | | **18** |